# ඇබෑර්තු

## ව්‍යාපෘති කාර්ය මණ්ඩල බඳවා ගැනීම

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 2 ව්‍යාපෘතිය

## පශ්චාත් දිට්වා සුළිකුණාටු ප්‍රතිසංස්කරණ හා ජීවනෝපාය සහාය ව්‍යාපෘතිය

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 02/2026 සහ රජයේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටි අනුව, පශ්චාත් දිට්වා සුළි කුණාටු ප්‍රතිසංස්කරණ හා ජීවනෝපාය සහාය ව්‍යාපෘතිය සහ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (දෙවන අදියර ව්‍යාපෘතිය) සඳහා පහත සඳහන් තනතුරු සඳහා "කොන්ත්‍රාත් පදනම මත" ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලත් හා කැපවීමෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (2028/12/31 දක්වා කාලය සඳහා) පශ්චාත් දිට්වා සුළි කුණාටු ප්‍රතිසංස්කරණ හා ජීවනෝපාය සහාය ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 25 - 200 ත් වන අතර, මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - දෙවන අදියර ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 536.5 ක් (ව්‍යාපෘති කාලය :- 2026 - 2031) වේ. තවද, මේ සඳහා දේශීය මූලාශ්‍රවලින්ද දායකත්වයක් ලබා දේ.

තනතුරට අදාළ වැටුප 2026/03/28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 02/2026 හි ඇමුණුම 02 හි සඳහන් කර ඇත.

පුරප්පාඩු - දිට්වා සුළි කුණාටු ප්‍රතිසංස්කරණ හා ජීවනෝපාය සහාය ව්‍යාපෘතිය

| අංකය | තනතුර | වැටුප් මට්ටම | තනතුරු ගණන | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 1 | ඉංජිනේරු | D | 01 | ප්‍රධාන කාර්යාලය - කොළඹ |
| 2 | ගණකාධිකාරී | D1 | 01 | |
| 3 | ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී | E | 02 | |
| 4 | සමාජ ආරක්ෂක නිලධාරී | F | 01 | |
| 5 | ප්‍රසම්පාදන නිලධාරී | F | 02 | |
| 6 | කළමණාකරණ සහකාර | MN - 2 | 03 | |
| 7 | කාර්යාල සහායක | PL 2 | 01 | |

| අංකය | තනතුර | වැටුප් මට්ටම | තනතුරු ගණන | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | C | 02 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |

| අංකය | තනතුර | වැටුප් මට්ටම | තනතුරු ගණන | සේවා ස්ථානය | ප්‍රාදේශීය කාර්යාලය | |
|---|---|---|---|---|---|---|
| | | | | | අනුරාධපුරය | පොළොන්නරුව |
| 1 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | C | 02 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 01 | 01 |
| 2 | ඉංජිනේරු සහකාර | E | 12 | | 10 | 02 |
| 3 | සැලසුම් ශිල්පී | F | 09 | | 06 | 03 |

**පුරප්පාඩු - මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (දෙවන අදියර ව්‍යාපෘතිය)**

| අංකය | තනතුර | වැටුප් මට්ටම | සේවා ස්ථානය | තනතුරු ගණන |
|---|---|---|---|---|
| 1 | ප්‍රමාණ සමීක්ෂක | D | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මඩාටුගම | 01 |
| | | | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මොරගහකන්ද | 01 |
| 2 | සැලසුම් ශිල්පී | F | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මඩාටුගම | 01 |
| | | | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මොරගහකන්ද | 01 |
| 3 | කළමණාකරණ සහකාර - ගිණුම් | MN - 2 | ව්‍යාපෘති කළමණාකරණ ඒකකය | 05 |
| 4 | කළමණාකරණ සහකාර | MN - 2 | ව්‍යාපෘති කළමණාකරණ ඒකකය | 03 |
| | | | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මඩාටුගම | 05 |
| | | | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මොරගහකන්ද | 06 |

**අදාළ චක්‍රලේඛ:**

- Category D - F වැටුප් මට්ටම් සඳහා කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2026 අදාළ වේ.
- සහාය කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 සහ කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2026 අදාළ වේ. (සහාය කාර්ය මණ්ඩල තනතුරු සඳහා බඳවා ගැනීමේදී රජයේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටි සලකා බලනු ලැබේ.)

අයදුම්කරුවන් වයස අවුරුදු 64ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව මෙන්ම රජයේ රෙගුලාසි පිළිබඳ හුරුපුරුදුකම සහ පරිගණක සාක්ෂරතාව අත්‍යවශ්‍ය මූලික සුදුසුකම් වේ. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ. දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්, ඉහත තනතුරු සඳහා අයදුම් කරන්නේ නම්, තම අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර සඳහා වෙබ් අඩවියට පිවිසෙන්න - https://mwsip.lk/careers/

**(ඉහත සඳහන් චක්‍රලේඛ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වෙත යොමුවන්න.)**

අයදුම්කරුවන් විසින් අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සඳහන් කරමින් සකස් කරන ලද ජීව දත්ත පත්‍රිකාවක් (Curriculum Vitae) සහ ඥාතීන් නොවන නිර්දේශකරුවන් දෙදෙනෙකුගේ සම්බන්ධතා විස්තර සහිත අයදුම්පත් 2026/10/26 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත ලැබෙන සේ එවිය යුතුය. දිට්වා සුළිකුණාටු ප්‍රතිසංස්කරණ හා ජීවනෝපාය සහාය ව්‍යාපෘතිය සහ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 2 ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල අදාළ පුරප්පාඩු සඳහා අයදුම් කරන අයදුම්කරුවන් විසින් අදාළ ව්‍යාපෘතියේ නම සහ අයදුම් කරන රාජකාරි ස්ථානය අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කර, වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම් කරන තනතුරේ නම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර II ව්‍යාපෘතිය,**
**(මානව සම්පත් අංශය), අංක 493/1/1, ටී. බී. ජයා මාවත, කොළඹ 10.**

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් (Canvassing) සිදුකිරීම නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED